# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,471 — 1958 අගෝස්තු 8 වැනි සිකුරාද — 8.8.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස—ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |

| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 1057 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... | 1069 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : කපූ.ඒ. 380/ජේ 57/ඊ509.

**1954 රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ සංශොධිත පනතින් සංශොධනය කළ පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ ගම්පහ පළාත් ආණ්ඩු සභාව තුළ 3 වැනි ඡන්ද කොට්ඨාශයේ මැදගම ගම්මුලාදෑනි කොට්ඨාශයේ විද්‍යාල පාරෙ පිහිටි වරිපනම් නො. 16 දරණ අක්කර ½ක පමණ විශාලකම් ඇති බිම් කැබෙල්ල.

ඊට මායිම් :—

උතුරට : ඊ. පී. රණතුංග මයා. සහ අනිත් අය අයිතිකම් කියන විහාර පාරේ පිහිටි වරිපනම් නො. 2,4,6, 8 සහ 10 දරණ කෝන්ගහවත්ත යන ඉඩම.

නැගෙනහිරට : විද්‍යාලය පාර.

දකුණට : කේ. සී. ජයසේන මයා. සහ අනිත් අය අයිතිකම් කියන විද්‍යාලය පාරේ පිහිටි වරිපනම් නො. 18 සහ 20 දරණ කෝන්ගහවත්ත යන ඉඩම.

බස්නාහිරට : රජයේ දුම්රිය දෙපාර්තමේන්තුව සතු වරිපනම් නො. 33 දරණ කෝන්ගහවත්ත යන ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති තුමා.

1958 ක්වූ ජූලි මස 9 වැනි දින,
කොළඹදීය.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධන) ආඥාපනතින් සංශෝධනය කළ පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරලයේ අදිකාරි පත්තුවේ බියගම සහ සියබලාපේ යන ගම්වල පිහිටි ඔවිටකුඹුර, නවන්කුඹුර, නොහොත් මන්දෝරගහකුඹුර, නවන්කුඹුර, මොරගහහේන සහ අලියබැස්සදෙනිය යන ඉඩම් වලින් අක්කර 0, රූ. 1, පර්චස් 24·7ක පමණ විශාලකම් ඇති ඉඩම් කැබලි 11ක ප්‍රමාණය—

සියබලාපේ

ඊට මායිම් :—

(1) ඔවිටකුඹුර (අක්. 0, රූ. 0, පර්චස් 02·0ක පමණ)—

උතුරට : බුලුගහ ඇල සහ එම ඉඩමේම ඉතිරි කොටස ;
නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ;
දකුණට : ඇල ;
බස්නාහිරට : —.

(2) ඔවිටකුඹුර (අක්. 0, රූ. 0, පාර්චස් 03·3ක පමණ)—

උතුරට සහ දකුණට : එම ඉඩමේම කොටස් ;
නැගෙනහිරට : ඇල ;
බස්නාහිරට : බුලුගහ ඇල.

(3) ඔවිටකුඹුර (අක්. 0, රූ. 0, පාර්චස් 3·0ක පමණ)—

උතුරට සහ දකුණට : එම ඉඩමේම කොටස් ;
නැගෙනහිරට : ඇල ;
බස්නාහිරට : බුළුගහ ඇල.

(4) ඔවිටකුඹුර (අක්. 0, රූ. 0, පර්චස් 10·5ක පමණ)—

උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස් ;
නැගෙනහිරට : ඇල ;
දකුණට : බුළුගහ ඇල.

(5) ඔවිටකුඹුර (අක්. 0, රූ. 0, පාර්චස් 10·3ක පමණ)—

උතුරට සහ නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස් ;
දකුණට : බුළුගහ ඇල ;
බස්නාහිරට : ඇල.

බියගම

(6) නවන්කුඹුර හෙවත් මන්දෝරගහකුඹුර (අක්. 0, රූ. 0, පාර්චස් 1·8ක පමණ)—

උතුරට : බුළුගහ ඇල ;
නැගෙනහිරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස් ;
බස්නාහිරට : ඩබ්ලිව්. ඊ. පෙරේරාට අයිති නවන්කුඹුර යන ඉඩම.

(7) නවන්කුඹුර (අක්. 0, රූ. 0, පාර්චස් 8·9ක පමණ)—

උතුරට : බුළුගහ ඇල ;
නැගෙනහිරට : ඩබ්ලිව්. ඊ. පෙරේරාට අයිති නවන්කුඹුර හෙවත් මන්දෝරගහකුඹුර යන ඉඩම ;
දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස සහ ඩබ්ලිව්. බී. පෙරේරාට අයිති මොරගහහේන යන ඉඩම ;
බස්නාහිරට : ඩබ්ලිව්. බී. පෙරේරාට අයිති මොරගහහේන යන ඉඩම.

(8) මොරගහහේන (අක්. 0, රූ. 0, පාර්චස් 13·8ක පමණ)—

උතුරට : බුළුගහ ඇල සහ ඩබ්ලිව්. ඊ. පෙරේරාට අයිති නවන්කුඹුර යන ඉඩම ;
දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ;
නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ ඩබ්ලිව්. ඊ. පෙරේරාට අයිති නවන්කුඹුර යන ඉඩම ;
බස්නාහිරට : අඩිපාර (රජය සතු).

(9) මොරගහහේන (අක්. 0, රූ. 0, පාර්චස් 1·8ක පමණ)—

උතුරට : ඇල්. ඩී. මාටින් සිංඤෝට අයිති අලියබැස්සදෙනිය යන ඉඩම ;
දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ;
බස්නාහිරට : ඇල්. ඩී. මාටින් සිංඤෝට අයිති අලියබැස්සදෙනිය යන ඉඩම ;
නැගෙනහිරට : අඩි පාර (රජය සතු).

(10) අලියබැස්සදෙනිය (අක්. 0, රූ. 0, පර්චස් 0·3 ක පමණ)—

උතුරට : එම ඉඩමේම කොටසක් ;
දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ;
නැගෙනහිරට : කේ. ඇල්. බී. පෙරේරාට අයිති මොරගහහේන යන ඉඩම.

(11) අලියබැස්සදෙනිය (අක්කර 0, රූ. 0, පර්චස් 9·0ක පමණ)—

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටසක් සහ බුළුගහ ඇල ;
නැගෙනහිරට : ඩබ්ලිව්. බී. පෙරේරාට අයිති මොරගහහේන් යන ඉඩම ;
දකුණට : එම ඉඩමේම කොටසක් සහ කේ. ඇල්. බී. පෙරේරාට අයිති මොරගහහේන යන ඉඩම ;
බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

අංක : කිව්.බී. 239/ජේ. 56 ඇල්. 303.

1958ක්වූ මැයි මස 21 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති,

අංකය: ආර් /කිව 199.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපණතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

උපලේඛනය

මූලික සැලැස්ම : ඒ 4,209—පිහිටීම : කොළඹ නාගරික සීමාව තුළ අංක 12 කොට්ඨාශය, පිටකොටුව.

| කැබැල්ල | නම | විස්තරය | අයිතිකරුගේ නම | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කෙයිසර්වීථියේ වරිපනම් අංක 7/42 සිට 7/64 සහ 7/80 සිට 7/91 හා 7 (කොටස) දරන පරණ ඕලන්ද කනත්ත | කපරාරුකළ බිත්තියක්, ඇස්බැස්ටෝ වහලයකින්යුත්, කපරාරුකළ ගොඩ නැගිල්ලක කොටසක්, ඇස්බැස්ටෝ වහලයකින් යුත් කපරාරුකළ ගොඩ නැගිල්ලක් සහිත මුඩුබිම | ලංකා ඕලන්ද පල්ලියේ ස්ක්‍රයිබා, අංක 28 වෙනි පටුමාවත ඒ, ඇතුලත මල්පාර, කොළඹ | 0 1 0·89 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 අගෝස්තු 25 වෙනිද පෙරවරු 10·15 වේලාවට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 අගෝස්තු 18 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වර්ෂ 1958ක්වූ ජූලි මස 28 දින,
කොළඹ කච්චේරියේදීය.

යූ. ඒ. ගුණරත්න,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

ඇල්. ඩී. 4902.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ පාතහේවාහැට ආදයම් කොට්ඨාශයේ, ගන්දහය උතුරු කෝරළේ, උල්පතකුඹුර, කැටවෙල සහ වැවතැන්න යන ගම්හි පිහිටි මුල් ප්ලැන් නො. ඒ 2460 ලොට් 1, 2, 3, 5, 6, 7 සහ 11 වශයෙන් මැන විස්තර කරන ලද ඇල්හේන වත්තේ අක්කර 61 රූඩ් 3 ,පාචස් 38 ක්වූ කොටස්. අයිතිවාසිකම් කියන්නේ බණ්ඩාරවෙල, අම්පිටිගොඩ වතුයායේ පදිංචි ඇස්. වෙල්ලයියා සහ ඇස්. පොන්නුසාමි යන මහත්වරුය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 12 වන දින පෙරවරු 9·30 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 සැප්තැම්බර් මස 5 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

තවද එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලේනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා.

1958 ක්වූ ජූලි මස 23 වන දින,
මහනුවර කච්චේරියේදීය.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපනතෙන් සංශෝධනය කරණලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ උඩගම්පහ කෝරළේ මැදවල ගම්මැද්දේ පිහිටි අක්කර 35, රූඩ් 3, පර්චස් 21 ක්වූ මුල් ප්ලැන් නො. ඒ 2,523 ලොට් නො. 1, 2, සහ 3 වශයෙන් මැන විස්තර කරණ ලද දියබුබුලවත්ත සහ අන්ගන්තැන්න වත්ත.

| ලොට් නො. | ඉඩමේ නම | අයිතිවාසිකම් කියන අය | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 1 | ... දියබුබුල වත්ත | ... මොරටුවේ පදිංචි කේ. ජේ. ඒ. ප්‍රනාන්දු මහතා ... ... | 12 | 0 | 23 |
| 2 | ... එම් ... | ... මහනුවර, මුල්ගම්පොල පාරේ පදිංචි කේ. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා ... | 16 | 2 | 14 |
| 3 | ... අන්ගන්තැන්න වත්ත | ... රම්බොඩ, වේවන්ඩන් වතුයායේ පදිංචි ඇස්. තොන්ඩමන් මහතා | 7 | 0 | 24 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 23 වන දින පෙරවරු 10 යට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි,

තවද 1958 සැප්තැම්බර් මස 16 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම් ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද එම ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරගැනීම පිණිස සහ එකී ඉඩම් ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියළුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

1958 ක්වූ අගෝස්තු මස 1 දින,
මහනුවර කච්චේරියේදිය.

---

සඳහන් අංකය : 3/40/49.

## 1954 රේ අංක 39 දරණ රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954 රේ අංක 39 දරණ රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරණ අඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

පැලැන : මූලික සිතියම් අංක ඒ. 2,525 ගම : පල්ලේයාය

| කැබැල්ල | නම | විස්තර | අයිතිකම් කියන්නාගේ නම | ප්‍රමාණය. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 ... | බන්ඩාරපොල වත්ත නොහොත් මුවන් දෙනිය වත්ත | අවුරුදු 40ක් වූ රබර් (පාළු වට ගිය) | සීමාසහිත බන්ඩාරපොල ලංකා සමාගම (ඒජන්තවරු: කොළඹ විටෝල් සහ සමාගම) ... | 7 2 12 |
| 2 ... | එම ... | එම | එම | 1 1 21 |
| | | | | 8 3 33 |

අත්කර ගැනීමට අදහස් කරන ඉහතකී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 සැප්තැම්බර් මස 12 දින පෙ. ව. 11.30 ට මාතලේ කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 58.9.5 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතු යයිද නියම කරමි.

මාතලේ කච්චේරිය,
1958 ජූලි මස 30 දය.

වී. පී. ඒ. පෙරේරා.
මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

---

සඳහන් අංකය : 3/40/61.

## 1954 රේ අංක 39 දරණ රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

(1) මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ අළුත්ගම ගමේ පිහිටි හයිවෝල්ටන් නමැති වත්තෙන් අක්කර 1, රූඩ් 2, පර්චස් 30ක පමණ බිම් ප්‍රමාණය.

දැනට අයිතිකම් කියන්නේ : මාතලේ ත්‍රිකුණාමල වීදියේ අංක 411හි වින්සන්ට් කුරේරා මහතා.

(2) මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ උනවේරුව සහ උඩස්ගිරිය ගම්වල පිහිටි හයිවෝල්ටන් නමැති වත්තෙන් අක්කර 33, රූඩ් 2, පර්චස් 0 ක පමණ බිම් ප්‍රමාණය.

දැනට අයිතිකම් කියන්නේ : මාතලේ ත්‍රිකුණාමල වීදියේ අංක 411 හි වින්සන්ට් කුරේරා මහතා.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 සැප්තැම්බර් මස 12 දින පස්වරු 2.30ට මාතලේ කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1958.9.5 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

1958 අගෝස්තු මස 1 දින,
මාතලේ කච්චේරියේ දිය.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

---

සඳහන් අංකය : 3/40/43.

## 1954 රේ අංක 39 දරණ රජයට ඉඩම් ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ රජයට ඉඩම ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

(1) මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොහොන්සිය පත්තුවේ පුරිජ්ජල ගමේ පිහිටි වරකන්ද වත්තේ වරකාමුර කොටසින් අක්කර 4, රූඩ් 2, පර්චස් 16ක පමණ බිම් කොටස් දෙක.

දැනට අයිතිකම් කියන්නේ : කොළඹ, තැපැල් පෙට්ටිය අංක 151 හි ජෝර්ජ් ස්ටුවට් සහ සමාගමෙහි ඒජන්තවරු සහ ලේකම්වරු.

(2) මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොහොන්සිය පත්තුවේ වරකාමුර ගමේ පිහිටි වරකන්ද වත්තේ වරකාවුර කොටසින් අක්කර 3, රූඩ් 1, පර්චස් 17ක පමණ බිම් කොටස් දෙක.

දැනට අයිතිකම කියන්නේ : කොළඹ, තැපැල් පෙට්ටි අංක 151හි ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගමෙහි ඒජන්තවරු සහ ලේකම්වරු.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 සැප්තැම්බර් මස 12 දින පෙ. ව. 10.30ට මාතලේ කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 958.9.5 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

මාතලේ කච්චේරිය,
1958 ජූලි මස 30 දය.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

---

සඳහන් අංකය : 3/40/35.

## 1954රේ අංක 39 දරණ රජයට ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ රජයට ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1)වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

(1) මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොහොන්සිය පත්තුවේ හුලංගමුව–හරස්ගම ගම්මුලාදැනි කොටසේ අගලවත්ත (නගරසභාවෙන් පිටත කොටස) සහ කන්දේගෙදර යන ගම්වල පිහිටා තිබෙන හුලංගමුව නමැති වත්තෙන් අක්කර 6, රූඩ් 3, පර්චස් 10ක පමණ බිම් ප්‍රමාණය (ඉඩම මැදින් යන ගම කාර්‍ය්‍ය සභා පාර හැර).

දැනට අයිතිකම් කියන්නේ : මාතලේ නැසීගිය ඇන්. පී. සෙල්ලයියා මහතාගේ උරුමක්කාරයන් ය.

(2) මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කොහොන්සිය පත්තුවේ හුලංගමුව-හරස්ගම සහ සිංහල නගර ගම්මුලාදැනි කොටස්වල කන්දෙගෙදර සහ දෙඩම්දෙනිය (මාතලේ නගර සභාවේ වෝඩ් 3) ගම්වල පිහිටි හුලංගමුව නමැති වත්තෙන් අක්කර 4, රූඩ් 2, පර්චස් 10ක පමණ බිම් ප්‍රමාණය.

දැනට අයිතිකම් කියන්නේ : මාතලේ නැසීගිය ඇන්. පී. සෙල්ලයියා මහතාගේ උරුමක්කාරයන්ය.

(3) මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ හුලංගමුව–හරස්ගම ගම්මුලාදැනි කොටසේ කන්දේ ගෙදර ගමේ පිහිටි හුලංගමුව වත්තෙන් අක්කර 1, රූඩ්. 1, පර්චස් 05ක පමණ හුදකලාව පිහිටි බිම් කොටස.

දැනට අයිතිකම් කියන්නේ : මාතලේ නැසීගිය ඇන්. පී. සෙල්ලයියා මහතාගේ උරුමක්කාරයෝ ය.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලයලත් නියෝජිතයන් 1958 සැප්තැම්බර් මස 12 දින පෙ. ව. 9.30ට මාතලේ කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1958.9.5. දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

මාතලේ කච්චේරිය,
1958 අගෝස්තු මස 1 දය.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

---

සඳහන් කළ යුතු අංකය : ඇල්ඒ/බී 32.

## 1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත : ගම් විශාල කිරීම.

ඉඩම් හා ඉඩම් සංවර්ධන පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ඔහුගේ 1954 සැප්තැම්බර් 4 වැනි දින අංක ජේ54 ඇල්113 (වීඊ) දරණ ප්‍රකාශනයෙන් තීරණය කර 1954 නොවැම්බර් මස 5 වැනි දින නො. 10,731 දරණ රජයේ ‘‘ ගැසට් ’’ පත්‍රයෙහි පළ කරන ලද පරිදි,

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය : තල්පෙ පත්තුව. ගම්මුලාදැනි වසම : හවුපෙ

ගම : හවුපෙ. සැලැස්මේ අංකය: අංක 651 දරණ අවසාන ගම් සැලැස්මේ අතිරේක අංක 1

| කැබලි අංක | ඉඩමේ නම | විස්තරය | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 266 | ටැරනියගොඩකන්ද ... ... | අවුරුදු 30ක් වන තේ ... ... ... | 0 | 2 | 20 |
| 267 | එම ... | පොල්, කොස් සහ පුවක් ඇතුලත් වත්ත සහ කුඩා පඳුරු සහිත කැලය ... | 25 | 2 | 1 |
| | | | 26 | 0 | 21 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකට කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 10 වැනි දින පූ.භා. 10 ට ගාල්ලේ දිසාපති කාර්‍ය්‍යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 සැප්තැම්බර් මස 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් තහවුරු කිරීමට අදාලවන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

අංක 651 දරණ අවසාන ගම් සැලැස්මේ අතිරේක අංක 1 පිටපතක් හවුපේ ගම්මුලාදැනි තැනගේ කාර්‍ය්‍යාලයෙහි බැලීට සඳහා තැන්පත් කර ඇත.

1958 ජූලි මස 28 වැනි දින,
ගාලු කච්චේරිය.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
ඉඩම් රජයට අත්පත්කර ගැනීමේ නිලධාරි තැන, ගාලු දිස්ත්‍රික්කය.

අංක : එල්. බී. 2296—ජේ. 56 ඊ 276.

**1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

70 වෙනි අවසාන ගම් සිතියමේ 2 වෙනි අතිරේක සැලැස්ම

| කැබලි අංකය | ඉඩමේ නම | ඉඩමේ විස්තර | අයිතිකරුවන්ගේ නම් හා ලිපිනය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 40 ... | මුදිගෙහේන නොහොත් ... දුම්මලහේන | අවු. 30ක් වයස ඇති රබර් ගස් 99ක්, අවු. 15ක් වයස ඇති පොල් ගස් 2ක්; අවු. 30ක් වයස ඇති කිතුල් ගසක් හා රඹුටන් ගස් දෙකක් ද තිබේ | පූජ්‍ය බානගල සීලරතන හිමි, බද්දෙගම; 2. ජේ. ඒ. සුවාරිස්, දෙහිගස්පෙ, පිටබැද්දර; 3. ඊ. ජී. සී. ගුණවර්ධන, පිස්කල් ආරච්චි, මාරඹ, අකුරැස්ස; 4. ඩී. පී. සමරවික්‍රම, කිබ්බොටුවාව, අකුරැස්ස හා එෆ්. එල්. දෝන කොර්නේලියා මහත්මිය, .එස්. ඒ. කොඩිතුවක්කු බාරේ, කඩවීදිය, අකුරැස්ස. | 1 2 20·5 |
| | | | එකතුව ... | 1 2 20·5 |

ඉහත සඳහන් ඉඩම පිහිටා ඇත්තේ මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩපත්තුවේ පානදුගමය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් 15 වැනි දින පූ. හා. 9.30 ට මාතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 සැප්තැම්බර් 6 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ගැන වන්දි ඉල්ලීමටැ ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත තමන් විසින් හෝ ඔවුන්ගෙන් ලියවිල්ලකින් බලය ලත් අයවලුන් විසින් ඉහතකී අන්දමට පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

එල්. එන්. ද එල්. බණ්ඩාරනායක,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

කච්චේරිය, මාතර
1958 ජූලි මස 31 වැනි දින.

---

සඳහන් අංකය : ජේ. 55 එල්ජී 536—එල්බී. 2270

**1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ ආඥපනත**

**7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි**

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම අංක ඒ 1,678

පහත සඳහන් ඉඩම පිහිටා ඇත්තේ, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුව හා කඩවත් සතරේ මාතර නගර සභා සීමාවතුල, 7 වෙනි ඡන්ද විමසීමේ කොටසේ වැලිවේරියේ කඩේවීදිය උතුරේය.

| කැබලි අංකය | ඉඩමේ නම | ඉඩමේ විස්තර | අයිතිකරුවන්ගේ නම් හා ලිපිනය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 ... | බතුතා පාරේ අංක 32 දරණ වරිපණම් අංකයෙන් කොටසක් වන හාල්පාහිනවත්ත | පොල්අතු ගෙයක් හා තාවකාලික ගොඩනැගිලි පහක් සහිත නිසරු බිමකි | එම්. එන්. එම්. හඩාඞ්, ඒ. එච්. එම්. යෙෂියා, එම්. සී. මුතුනච්චියා සහ ඒ. එච්. සිතිසෙයිනා සියලුදෙනාම, මාතර මහ වීදියේ ''නුහුවිලා'' හිය | 0 1 25·08 |
| 2 ... | එම ... | පාර ... | එම ... | 0 0 09·78 |
| 3 ... | එම ... | පොල්අතු ගෙයකින් කොටසක් හා අවු. 40කට වඩා පැරණි පොල්ගස් 7කින් යුත් ඉඩමකි | එම | 0 0 11·59 |
| | | | එකතුව .... | 0 2 6·45 |

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1958 සැප්තැම්බර් මස 15 වෙනි දින සවස 2ට මාතර කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1958 සැප්තැම්බර් මස 6 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දන්වීමකින් මට ලියා දන්විය යුතුයයි ද නියම කරමි.

එල්. එන්. ද එල්. බණ්ඩාරනායක,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය,
1958 ජූලි මස 31 වෙනි දය.

අංකය : ඇල්ඩී 7568.

## 1950 අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ කම්බුස්සාවෙල ගමේ පිහිටා ඇති ඉඩම
298 අ.ග.සි. 4 අතිරේකය

| ලොට | නම | වගාවේ විස්තර | බිම්තරම අ. රූ. ප. | වැඩි විස්තර | අයිතිකම් කියන්නෝ |
|---|---|---|---|---|---|
| 164 | ... පැල්මන්ඩිය ... | අවුරුදු 20–25 වන පොල් ගස් 11 සහ ස්ථිර පාසැල් ගොඩනැගිල්ලේ කොට සක් | 0 0 24·2 | ලොට් 64න් කොට සක්. ගොඩනැගිල්ල අධ්‍යාපන දෙපාර්ත මේන්තුව මගින් | බෙලිඅත්තේ කම්බුස්සාවෙල මීගස්දෙනිය කම්කානම්ගේ සාදිරිස් |
| 165 | ... මහවත්ත ... | අවු. 20–25 පමණ වන පොල්ගස් 14, අවු. 10 පොල්ගස් 2, අවු. 5 දෙල් ගස් 1, අවු. 2 පුවක් ගසක්, අවු. 40 කජු ගසක් | 0 0 29·6 | ලොට් 64 න් කොටසක් | බෙලිඅත්තේ, කම්බුස්සාවෙල පදිංචි අය වලුන්වන වික්‍රමසිංහ පතිරනගේ බිලිඳු හාමි, එම විජේදස, එම දියෝනිස් ; හම්බන්තොට ස්වර්ණ සිරි හෝටලයේ වික්‍රමසිංහ පතිරනගේ කරුණාදස, අංක 1, මරදන කොට්ඨාසයේ නො. 221 හි වික්‍රමසිංහ පතිරනගේ කරුණාපාල කෝට්ටගොඩ ; බඹරන්දේ වික්‍රමසිංහ පතිරනගේ පිදරහාමි |
| 166 | ... පාලුවත්ත ... | අවු. 5–10 වන පුවක් ගස් 2 යි | 0 0 06·4 | එම ... | බෙලිඅත්තේ කම්බුස්සාවෙල, දෙන් හෙන්ද්‍රික් රාමනායක |
| 167 | ... පින්කැල්ල ... | අවුරුදු 20–25 වන පොල් ගස් 28, අවු. 5–10 පොල් ගස් 2, අවු. 5 වන පුවක් ගසක් | 0 0 21·9 | ලොට් 136 න් කොට සක් | බෙලිඅත්තේ කම්බුස්සාවෙල ශ්‍රී විජයාරාම යේ නිකදෙනියෙ සාරානන්ද තෙරුන් නාන්සේ |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 ඔක්තෝබර 10 දින උදේ 10 වේලාවට කම්බුස්සාවෙල රජයේ පාසැලේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 ඔක්තෝබර 2 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ටී. සිවඥනම්,
හම්බන්තොට පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

1958 ක්වූ අගෝස්තු මස 1 දින,
හම්බන්තොට කච්චේරියේදිය

---

ඇල්. ඒ. 10.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

ඌව පළාත, බදුළු දිස්ත්‍රික්කය, යටිකිඳ ආදායම් පාළක කොට්ඨාශය, රිල්පොල කෝරළය, රඹුක්පොත ගම.
37තේ අන්තිම ගම් සිතියමට අතිරේක අංක 4

| කැබලි | ඉඩමේ නම | විස්තරය | හිමිකම් කියන අය | බිම් ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 143 | හිඟුරුගමුව වත්ත ... | අවු. 40ක් පමණ වයසැති රබර් ගස් 11ක් අඩංගුවේ .. | සීමාසහිත එණුව ලංකා තේ සහ රබර් වතු සමාගම, ඒජන්තවරු ; හැරිසන් සහ ක්‍රොස්ෆීල්ඩ් සමාගම, කොළඹ | 0 0 15·6 |
| 144 | එම ... | අවු. 40ක් පමණ වයසැති තේ ... | එම ... | 0 2 12·0 |
| 145 | එම ... | අවු. 40ක් පමණ වයසැති එක් ගසක් ... | එම ... | 0 0 03·1 |
| 146 | එම ... | අවු. 40ක් පමණ වයසැති රබර් ගස් 6ක් වේ | එම ... | 0 0 16·9 |
| 147 | එම ... | අවු. 40ක් පමණ වයසැති තේ ... | එම ... | 0 0 37·0 |
| 148 | එම ... | අවු. 40ක් පමණ වයසැති රබර් ගස් 10ක් පමණි | එම ... | 0 0 29·5 |
| | | | එකතුව ... | 1 0 34·1 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් 16 වැනි දින උදේ 11ට බදුලු කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 සැප්තැම්බර් 9 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරගැනීම පිණිස එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන්ද සියළුම ඔප්පු සහ ලියකියවිලි ද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළයුතුය.

1958ක්වූ අගෝස්තු මස 2 වැනි දින,
බදුල්ලේ කච්චේරිය.

ඇන්. ඩී. ජයවීර,
බදුළු දිසාවේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

අංකය: *L.A.* 62

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

ඇ/ප්.ටී.පී. 48වේ පිට් නො. 1—බදුළු දිස්ත්‍රික්කයේ බුත්තල කොට්ඨාශය, බුත්තල කෝරළය. හොරබොක්ක ගම

| කැබලි අංකය | ඉඩමේ නම | විස්තරය | හිමිකම් කියනු අය | බිම් ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 285 | අරමුදල්ගොඩ ... | අළුතින් සුද්ද කරණලද ඉඩම, ස්ථිර ගොඩ නැගිලි 2ක් අඩංගුවේ. බඳින ලද ළිඳක්ද ඇත. | රුහුණුමහ කතරගම දේවාලය-බාරකාර ඩබ්ලියු. ඒ. රත්වත්ත මහතා, බදුල්ල | 3 | 0 | 00·4 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 සැප්තැම්බර් මස 16 වන දින උදේ 9.30ට බදුළු කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1958 සැප්තැම්බර් මස 9 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දනුම්දිය යුතුයි තවද ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවයෙන්ද සියලුම ඔප්පු සහ ලිය කියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

1958ක්වූ අගෝස්තු මස 2 දින,
බදුල්ලේ කච්චේරියේදීය.

ඇන්. ඕ. ජයවීර,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

---

අංකය : එල්.ඒ. 5532

## 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

සැලැස්මේ අංකය : පී.පී.ඒ·905. ගම—වලගම

| බිම් කට්ටි අංකය | ඉඩමේ නම | ඉඩමේ විස්තර | අයිතිකම් කියන්නා | ප්‍රමාණය. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | දන්දෙනිවෙලේ කුඹුර ... | කුඹුර ... ... ... | ජීවානදෙනියේ එස්. ඒ. ඩිංගිරි අප්පුහාමි ... | 0 | 0 | 1·7 |
| 2 | නාරන්ගොඩ වත්ත ... | පොල් ගස් 12ක්, කොස් ගස් 1ක්, කදුම්බේරිය ගසක්, කොලොන්ගයක් සහ පුවක් ගසක් තිබෙන වත්ත | වලගම එච්. ඒ. රොමානිස් අප්පුහාමි ... | 0 | 0 | 13·5 |
| 3 | ගල්බොඩකැලේ වත්ත ... | මාගෝසා ගසක්, රටදෙල් ගයක්, පොල් ගස් 2ක්, අඹ ගසක් සහ කොස් ගසක් තිබෙන වත්ත | වලගම, ආර්. ඒ. මාටින් අප්පුහාමි ... | 0 | 0 | 10·0 |
| 4 | එම ... | පොල් ගස් 5ක්, කොස් ගස් 3ක්, පුවක් ගයක්, කජු ගසක්, දෙඹ ගසක් සහ රබර් ගස් 5ක් තිබෙන වත්ත | වලගම, ඩී. පී. බාලසූරිය, ආර්. ඒ. සේදිරිස් සිංඤෝ, එල්. ඒ. බේබි නෝනා සහ ආර්. ඒ. හේරත් සිංඤෝ | 0 | 0 | 2·4 |
| 5 | එම ... | පොල් ගස් 3ක් සහ පුවක් ගස් 8ක් තිබෙන වත්ත ... | වලගම, පී. එච්. බයියා සහ පී. එච් කිරිළක්කු ... | 0 | 0 | 7·8 |
| 6 | එම ... | පොල් ගසක් තිබෙන වත්ත ... ... | වලගම, පී. කේ. හෙන්ද්‍රික් සිංඤෝ, පී. කේ. සයිමන් සිංඤෝ, පී. කේ. පොඩි හාමිනේ, පී. කේ. ඇලිස් නෝනා, පී. කේ. සිරිසේන, පී. කේ. රොසලින් නෝනා සහ පී. කේ. කරුණාවතී | 0 | 0 | 2·1 |
| 7 | එම ... | පොල් ගසක්, අඹ ගස් 2ක් සහ කොස් ගසක් තිබෙන වත්ත | එම ... | 0 | 0 | 5·5 |
| 8 | වැකන්දේ වත්ත ... | මුඩු බිම ... ... ... | වලගම, වයි. ආර්. හරමානිස් අප්පුහාමි, යූ. තෙපානිෂ් සහ ගලගෙදර එච්. ඒ. ලූසිහාමි | 0 | 0 | 0·8 |
| 9 | එම ... | පොල් ගසක් තිබෙන වත්ත ... ... | එම ... | 0 | 0 | 4·4 |
| 10 | එම ... | මුඩු බිම ... ... ... | දේවාලේගම, ඒ. පිංචිඅප්පුහාමි ... | 0 | 0 | 0·8 |
| 11 | පල්ලේමුත්තෙට්ටුවේ පිල්ලෑව | පොල් ගසක් සහ පොල් පැල 2ක් තිබෙන වත්ත ... | වලගම, ඊ. ඒ. පියදස ... | 0 | 0 | 3·8 |
| 12 | වැකන්දේ වත්ත ... | පොල් ගස් 2ක්, පුවක් ගස් 11ක්, සහ කොස් ගසක් තිබෙන වත්ත | වලගම, ජේ. ඒ. සෙලෙස්තිනාහාමි සහ ජේ. ඩී. ඊව්ජින් නෝනා | 0 | 0 | 3·5 |
| 13 | නාගහලන්දේවත්ත ... | පුවක් ගස් 2ක්, හල්මිල්ල ගසක්, සහ රටදෙල් ගස් ගස් 2ක් තිබෙන වත්ත | වලගම, ජේ. ඩී. ජෝසප් හෙන්රි ... | 0 | 0 | 7·7 |
| 14 | හිටිනාවත්ත ... | පුවක් ගස් 2ක් සහ දෙඩම් ගසක් තිබෙන වත්ත ... | වලගම, ඊ. ඒ. ජයතිලක, ඊ. ඒ. පියදස, ඊ. ඒ. අබේසිංහ, සහ එස්. ඒ. ලැයිසාහාමි | 0 | 0 | 0·4 |
| 15 | එම ... | මුඩු බිම ... ... ... | වලගම, වී. එන්. ගිනා ... | 0 | 0 | 2·1 |
| 16 | පාලුවත්ත ... ... | ටැන්කියක් තිබෙන වත්ත ... ... | වලගම, එස්. එන්. සෙව්වන්ගා ... | 0 | 0 | 2·8 |
| 17 | එම ... | පොල් ගසක්, පුවක් ගස් 2ක් සහ ගොඩනැගිල්ලක කොටසක් තිබෙන වත්ත | වලගම, එස්. කරුණානායක සහ ඊ. ආර්. පියදස | 0 | 0 | 2·0 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958.10.2 වැනි දින පූ.භා. 10 ට වලගම් කනිෂ්ඨ පාසැලේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958.9.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 අගෝස්තු මස 1 වැනි දින,
කෑගල්ලේ කච්චේරිය.

එල්. බී. හුලන්ගමුව,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඇල්. ඇස්. 3736/ඇල්. ජේ.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තුමාගේ කොට්ඨාශයේ අළුගොල්ල ගමේ පිහිටි අංක 251 දරණ අවසාන ගම් සිතියමේ 155 සහ 156 දරණ බිම් කට්ටිවලින් අක්කර 10ක පමණ බිම් කැබැල්ලක් කලායතනයක් හා සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා නුගේගොඩ 'නම්බපානි කලායතනයේ' අධ්‍යක්ෂක වන විජේසිංහ ප්‍රේම කුමාර එපිටවෙල මහත්මයා බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. ඉල්ලුම් කර ඇති ඉඩම අවශ්‍ය කාරණයට දීමට තිබේ. එම ඉල්ලීම පරිදි ආණ්ඩුවේ සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට එම ඉඩම බදු දීමට යෝජනා කර ඇත :—

(අ) කාලය : අවුරුදු 5 යි.

(ඉ) බද්ද : අවුරුද්දකට රුපියල් 10 යි.

(උ) බදුකරු විසින් බද්ද ආරම්භවූ අවුරුදු 5 ක් ඇතුළත, මාතලේ දිසාපති තුමන්ගේ සිත් ගන්නා පරිද්දෙන්, මෙකී ඉඩමේ කලායතනයක් හා සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකළ යුතුයි. එසේ ඒ වුවමනා ගොඩනැගිලි ආදිය ඉදිකළහොත් අවුරුදු 5හ අවසානයේදී තවද අවුරුදු 94ක බද්දක් දීමට සලකා බලනවා ඇත.

(එ) බදුකරු විසින් මෙම ඉඩම යථොක්ත කාරණය සඳහා යොදනවා විනා අන්කිසි කටයුත්තකට නොයෙදවිය යුතුය.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත බද්ද නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 ජූලි මස 8 වෙනි දින,
කොළඹ දීය.

---

ඇල්. ජේ. (ඇල්. ඇස්.) 3958.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වවුනියාවේ රජයේ සේවක විනෝද සමාජයේ භාරකාරයන් වන ඕ. ආර්. රයිව්, ජී. ඇම්. සිත්තම්බලම් සහ ටී. සිවසුබ්‍රමනියම් යන මහත්වරු සමාජ ශාලාවක්, වොලිබෝල් පිට්ටනියක්, බැඩ්මින්ටන් පිට්ටනියක් සහ ටැනිස් පිට්ටනියක් සෑදීම පිණිස වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා නගර සීමාව තුළ පිහිටි, 66 පිඹුරයට අයිති අංක 601, 602, 603 වැනි බිම් කට්ටිවල අක්කර 2 යි, රූඩ් 3 ක් පමණ ආණ්ඩුවේ ඉඩම් කැබෙල්ලක් බද්දට දෙන ලෙස ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙමි.

2. ඉල්ලන ලද ඉඩම මේ සඳහා දීමට තිබේ. ඉල්ලීම පරිදි රජයේ සෙසු කොන්දේයි වලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේයි වලටද යටත්කොට ඉඩම් කැබෙල්ල බදු දීමට අදහස් කර ඇත :—

(අ) කාලය : අවුරුදු 99 යි.

(ආ) බද්ද අවුරුද්දකට රු. 13.75 යි.

(ඉ) බදුකාරයන් විසින් බද්ද, ආරම්භවූ අවුරුද්දක් ඇතුළත, මේ ඉඩමේ සමාජ ශාලාවක් සහ ක්‍රීඩා පිට්ටනියක් වවුනියාවේ රජයේ දිසාපති තුමාගේ සිත් ගන්නා පරිදි ඉදිකළ යුතුය.

(ඊ) බදුකාරයන් විසින් මේ ඉඩම ඉහත සඳහන් කාරණය සඳහා විනා අන්කිසි කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළතදී ඉඩම් කැබෙල්ල බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව ඉඩම බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 අගෝස්තු 8 වෙනිදා
කොළඹ දීය.

---

ඇල්. ජේ. 299.

## 1948 රජයේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

ත්‍රිකුණාමලයේ, චීනවරාය නමැති ගමේ පිහිටි, අංක 17 දරණ අවසාන ගම් සිතියමේ 24 වෙනි කැබැල්ල වශයෙන් පෙන්වා තිබෙන ඉඩමෙන්, අක්කරයක පමණ ප්‍රමාණයක්, දැනට දී තිබෙන, අක්කර බාගයට අමතර වශයෙන් දෙන ලෙස චීනවරායේ ආලිම් අප්පාගේ සිද්ධස්ථානයේ භාරකරුවන් වන මොහමඩ් එහතාර් හඩ්ජියාර් මොහමඩ් අලි, සයිනුඩීන් මොහමඩ් සකාරියා, ජූනුස් මොහමඩ් බුහාරී, සායිඩ් අබ්දුල් කාඩර් බදූර්ඩීන්, නූර් මොහමඩ් අලිම්, මොහමඩ් ගනීපා හඩ්ජියාර්, ඉස්මයිල් රැම්බිලාත් අබ්දුල් මුහාලිජ් සහ බාසූර් ලෙබ්බෙයි යන අයවලුන් විසින්, මුරකරු නිවාසයක් හා පූජකතැන ගේ වාසස්ථානයක් සෑදීම සඳහා, බදු ඉල්වා තිබෙන බව මෙයින් දැනුම් දෙමි.

2. මෙම ඉඩම මේ සඳහා දීමට තිබේ. සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන්, පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට මෙම ඉඩම දීමට අදහස් කර තිබේ :—

(අ) දැනටමත් බදුදී තිබෙන අක්කර $\frac{1}{2}$ යේ බිම් කොටසේ බද්ද අවසාන වන විටම, මෙම බද්දත් අවසාන විය යුතුයි. (ඇල්. ජේ. 299 සහ 55.7.15 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ නිවේදනය බලන්න.)

(ආ) බද්ද : අවුරුද්දට රුපියල් 2යි.

(ඉ) බදුකරුවන්, බද්ද ලබාගෙන අවුරුද්දක් ගතවීමට පෙර, ත්‍රිකුණාමලයේ දිසාපති තැනගේ කැමැත්තට සරිලන පරිදි, මුරකරු නිවාසයක් හා පූජකතැනගේ වාසස්ථානයක් ද සාදා නිමකළ යුතුයි.

(ඊ) බදුකරුවන්, මෙම ඉඩම, ඉහත සඳහන් (ඉ) ඡේදයේ දැක් වෙන කටයුත්තට හැර, අන්කිසි කටයුත්තක් සඳහා නො යෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දිනයේ සිට, සති හයක් ගතවන්නට පෙර, මෙම ඉඩම නොදීමට පිළිගැනෙන හේතූන් මා වෙත ලියා නොඑව්වොත්, මෙම ඉඩම බද්දට දෙන්නෙමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 අගෝස්තු මස 8 වෙනිදා
කොළඹ දීය.

---

ඇල්. ඇස්. 3896.

## 1948 රජයේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, තම්පලාකාමම් පත්තු, ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත්, සින්නාකිත්තිය යන ගම පිහිටි, 6 වෙනි ඇෆ්. ටී. පී. සිතියමේ, 5 වෙනි ඉන්සෙට්හි, 4 වෙනි අතිරේකයෙහිවූ, අංක 2317 දරණ අක්කර 2, රූඩ්ස් 0, පර්චස් 28.5 ක විශාලත්වය ඇති බිම් කට්ටිය, තමාට විකුණන ලෙස, ත්‍රිකුණාමලේ, කෙලින් වීදියේ පදිංචි අප්පාපිල්ලෙයි කනගසිංහම් යන අය විසින් ඉල්ලුම් කොට තිබෙන බැව් මෙයින් නිවේදනය කරමි.

2. ආණ්ඩුවේ දෙමල මිශ්‍ර පාඨශාලාවක් ඉදි කිරීම සඳහා, මෙම ඉඩම, 1944.12.18 වෙනි දින, රුපියල් 299 ශත 48 කට, ඉල්ලුම් කරුගෙන් රජය මිලදී ගත්තකි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවට හෝ රජයේ අන් කිසි කටයුත්තක් සඳහා හෝ, මෙම ඉඩම අවශ්‍ය නොවේ. එමනිසා, මෙය කලින් අයිතිකරුව සිටි, අප්පාපිල්ලෙයි කණගසිංහම් මහතාටම, රජය මොහුගෙන් ඉඩම ගත් මුදල වන රුපියල් 299 ශත 48 කටම ඉඩම විකිණීමට අදහස් කොට තිබේ.

3. මෙහි සඳහන් දින සිට, සති 6ක් ඇතුළත දී මීට විරුඬව සැහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත්, ඉල්ලීම අනුව ඉඩම මොහුට විකුණනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 අගෝස්තු මස 8 වෙනිද
කොළඹ දීය.

---

ඇල්. ජේ. 1556.

## 1948 රජයේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

පුත්තලම් පාලක දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු සහ කඩවත්හි ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, මදුරන්කුලිය නමැති ගමේ, අංක 3251 දරණ මූලික සැලැස්මෙහි, නොම්මර 14,597 දරණ බිම් කට්ටියෙන් රූඩ්ස් 2½ක් පමණවූ රජයේ ඉඩම් කැබැල්ලක්, හින්දු දේවස්ථානයක් ගොඩ නැඟීම සඳහා, මදුරන්කුලියේ "සයිවා මහා සභාවේ" භාරකාරයන් වන, මදුරන්කුලියේ, සින්නප්පු නඩරාජා, සින්නප්පු තාමෝතරම් පිල්ලේ සහ තම්බිපිල්ලේ නඩරාජා යන අය විසින් බදු ඉල්ලා ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

2. ඉදි කිරීමට යන හින්දු දේවස්ථානයෙන්, මදුරන්කුලියේ සහ එහි අවට ගම්වල වෙසෙන හින්දු පවුල් 51 කට සේවාවක් වනු ඇත. අවශ්‍යව ඇති කාරණය සඳහා ඉඩම බදු දීමට පිළිවන. රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන්, පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට, එකී ඉඩම බදු දීමට අදහස් කර ඇත :—

(අ) කාලය : අවුරුදු 99 සි.

(ආ) බද්ද : අවුරුද්දකට රුපියල් 1.50 සි.

(ඉ) බද්ද ආරම්භවන දින සිට අවුරුද්දක් ඇතුළතදී, පුත්තලමේ දිසාපති තුමා ගේ සිත් ගන්නා පරිදි, එකී ඉඩමෙහි හින්දු දේවස්ථානයක් තනා නිම කළ යුතුයි.

(ඊ) බදු කරුවන් විසින් මෙම ඉඩම හින්දු දේවස්ථානයක් වෙනුවෙන් මිස, අන්කිසි කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට, සති 6ක් ඇතුළත, මෙම ඉඩම බදු නොදිය යුතු බවට සැහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත්, ඉල්ලීම අනුව මෙම බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් තැන වෙනුවට.

1958 අගෝස්තු 8 වෙනි දින
කොළඹදීය.

---

ඇල්. ජේ. 1545.

## 1948 රජයේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කල්පිටිය ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයෙහි, පොම්පාරිප්පු පත්තුවෙහි, කරඹිපූවල් ප්‍රදේශයේ, අම්බලම් ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයෙහි පිහිටි, වයඹ පළාතේ අංක 7387 දරණ මූලික සැලැස්මේ රජය සතු සින්හකට්ටකාඩු නමැති 71 වැනි ඉඩම් කට්ටියෙන් අක්කර 3 ක ඉඩම් කැබැල්ලක් බෞද්ධ සිද්ධස්ථානයක් ගොඩනැංවීම සඳහා "මල්විල රජමහා විහාර වර්ධන" සමිතියේ භාරකාරයන් වන මායියාවේ සඬානන්ද සවාමීන් වහන්සේ, මල්විල මිනිමුතු පතිරෙන්නෙහෙලගේ පොඞි! සිංඤෝ සහ දිසානායක මුදියන්සෙලාගේ පොඩිසිංඤෝ යන අය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරමි.

2. ඉදිකිරීමට අදහස් කර ඇති බෞද්ධ සිද්ධස්ථානය හේතුකොට ගෙන කරඹිපූවල් සහ අම්බලම් කොට්ඨාශයේ පළාත් වාසී බෞද්ධ ජනතාවට සේවාවක් වනු ඇත. අවශ්‍යව ඇති කාරණය සඳහා ඉඩම දීමට පිළිවන. රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට එකී ඉඩම බදු දීමට අදහස් කර ඇත :—

(අ) බද්ද : අවුරුද්දකට රුපියල් 1 යි.

(ඉ) බද්ද ආරම්භවන දින සිට අවුරුදු 5 ක් ඇතුළතදී පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමාගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි (මෙහි බෞද්ධ සිද්ධස්ථානයැයි නම් කරන) ධර්ම ශාලාවක්, ආවාසයක්, විහාරයක් සහ දා ගැබක් බදු කරුවන් විසින් සාදා නිම කළ යුතුයි,

(උ) බදු කරුවන් විසින් මෙම ඉඩම බෞද්ධ සිද්ධස්ථානයක් වෙනුවෙන් මිස අන්කිසි කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

(එ) බෞද්ධ සිද්ධස්ථානය සාදා නිමකොට හය මාසයක් ඇතුළතදී බදු කරුවන් විසින් මහා භාරකාර තැන අනුමත කරන ඔප්පුවක් පිට එම සිද්ධස්ථානය මහා සංඝ රත්නයට පූජා කළ යුතුයි. එසේ කරනු ලැබූ පසු, මෙම ඉඩම, සිද්ධස්ථානය භාරකරුට හෝ විහාරාධිපතීන් වහන්සේට හෝ 99 අවුරුදු ක්‍රමයට බදු දෙනු ලැබේ.

3. මෙහි සඳහන් දිනයේ සිට සති 6 ක් ඇතුළතදී මෙම ඉඩම නොදිය යුතු බවට සැහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත්, ඉල්ලීම අනුව ඉඩම බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ දීය.

---

ඇල්. ජේ. 1227.

## 1948 රජයේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කැරගල්, ඩෆ්ජ්ටර් සෙයිලනි මුස්ලිම් පල්ලියේ, පාලක භාරකාර තැන වන සී. ඇල්. ඇම්. මරික්කාර් හජ්ජියාර් යන අය විශ්‍රාම ශාලාවක් (මඩමක්) සෑදීම සඳහාත්, රථ නැවැත්වීමේ ප්‍රයෝජනය පිණිසත්, රත්නපුර දිස්ත්‍රික්කයේ, තැන්ජන්තැන්නේ පිහිටි, 810 වැනි ගම් සිතියමට අයිති, 132 වැනි බිම් කට්ටියෙන් අක්කර තුනක් පමණවූ ආණ්ඩුවේ බිම් කැබෙල්ලක් බද්දට දෙන ලෙස ඉල්ලා ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

2. මෙම ඉඩම රථ නැවැත්වීම සඳහා දැනට පාවිච්චිකරනු ලැබේ. මේ සඳහා දීමට ඉඩම් තිබේ. එසේම, මේ ඉල්ලීම පරිදි, ආණ්ඩුවේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන්, මෙහි පහත පෙනෙන කොන්දේසි වලටද යටත් කොට ඉඩම් කැබෙල්ල බදු දීමට ආණ්ඩුව අදහස්කර තිබේ :—

(අ) කාලය : අවුරුදු 10 සි.

(ආ) බද්ද : අවුරුද්දකට රු. 1.50 සි.

(ඉ) බදුකරු විසින් බද්ද ආරම්භ වන දින සිට තෙමසක් ඇතුළතදී මේ ඉඩම තුල විශ්‍රාම ශාලාවක් (මඩමක්) රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් ඉදිකරවිය යුතුයි. තවද, ඉතිරි කොටස රථ නැවැත්වීම පිණිස පාවිච්චි කළ යුතුයි.

(ඊ) කුලය, ජාතිය හා ආගම නොතකා සියලුම වන්දනා කරුවන් ගේ රථ වාහන මෙහි නැවැත්වීමට ඉඩ දිය යුතුයි.

(උ) බදුකරු විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් මෙම රථ නැවතුම් පොල තබා ගත යුතුයි.

(ඌ) ඉහත සඳහන් (ඉ) දරණ කොන්දේසියෙහි කියවෙන කරුණු වලට හැරෙන්ට අන් කරුණක් සඳහා ඉඩම නොයෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දිනයේ සිට සති හයක් ඇතුළත දී ඉඩම් කැබෙල්ල නොදිය යුතු බවට සැහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව ඉඩම බදු දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්දිස්.
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 අගෝස්තු මස 8 දින.
කොළඹ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.